# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 510 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 23/03/2024 පැය 1710

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන - ප්‍රජා පොලිස් කොට්ඨාසය.**

රත්නපුර හා ඇඹිලිපිටිය පොලිස් කොට්ඨාස වලට අයත් ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩසටහනක් 2024.03.23 වන අද දින පෙරවරු 1000 ට මහජන ආරක්ෂාව පිළිබඳ ගරු අමාත්‍ය ටිරාන් අලස් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වියානි ගුණතිලක මහතා සහ පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ සහභාගිත්වයෙන් කුරුවිට ග්‍රෑන්ඩ් ගාර්ඩියන් හෝටල් පරිශ්‍රයේදී පැවැත්විණි.

රත්නපුර සහ ඇඹිලිපිටිය පොලිස් කොට්ඨාස වලට අයත් ග්‍රාම සේවා වසම් 585කට අයත් ප්‍රජා පොලිස් කමිටු සමාජිකයින් 1500ක පමණ පිරිසක් මෙම අවස්ථාවට සහභාගී වූ අතර මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් මහතා සහ පොලිස්පතිතුමා කමිටු සාමාජිකයින් අමතා මත්ද්‍රව්‍ය ජාවාරම් හා සංවිධානාත්මක අපරාධ කල්ලි ක්‍රියාකාරකම් මෙරටින් තුරන් වන තෙක් යුක්තිය මෙහෙයුම ඉදිරියටත් ක්‍රියාත්මක කරන බවට ප්‍රකාශ කරන ලදි.

මෙහිදී පාසල් දරුවන් සඳහා පාසල් උපකරණ සහිත පාසල් බෑගයක් බැගින් ප්‍රදානය කිරීම, 2023 අන්තර් කොට්ඨාස පාපන්දු තරඟාවලියෙහි හොඳම පිටත කොට්ඨාස කණ්ඩායම වශයෙන් කුසලානය දිනා ගත් රත්නපුර කොට්ඨාස කාන්තා කණ්ඩායම හා පුහුණුකරුවන් උදෙසා රුපියල් 195,000/= ක මුදල් ප්‍රදානය කිරීම, කුරුවිට පොලිස් වසමේ මනුෂ්‍ය ඝාතනයක් සිදු කර මරණ දඬුවම නියමව වසර 23 ක් සැඟව සිටි වූදිතයෙකු අත්අඩංගුවට ගැනීමෙන් කරන ලද යහපත් සේවය උදෙසා කුරුවිට පොලිස් ස්ථානයේ ප්‍රධාන පොලිස් පරීක්ෂක උදයශාන්ත නිලධාරියාට රුපියල් 50000/= ක ත්‍යාග මුදලක් පිරිනැමීම හා යුක්තිය මෙහෙයුම සඳහා සක්‍රීය දායකත්වය ලබා දෙමින් සාර්ථක වැටලීම් සිදු කරන ලද නිලධාරීන් ඇගයීම සඳහා රත්නපුර කොට්ඨාසයේ නිලධාරීන් කිහිප දෙනෙකුට මුදල් ත්‍යාග ප්‍රදානය කිරීමක්ද පොලිස් ත්‍යාග අරමුදලෙන් සිදු කරන ලදී.

ගරු මහජන ආරක්ෂක අමත්‍ය ටිරාන් අලස් මහතා, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වියානි ගුණතිලක මහතා සහ පොලිස්පතිතුමා වෙත සබරගමුව පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සංජීව ධර්මරත්න මහතා විසින් සමරු තිළිණ ප්‍රදානය කිරීමක් ද සිදු කෙරිණි.

මෙම අවස්ථාව සඳහා විශේෂ කාර්ය බලකායේ අණදෙන නිලධාරී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරුණ ජයසුන්දර, රත්නපුරය කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කපිල ප්‍රේමදාස, ඇඹිලිපිටිය

කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සුදත් මාසිංහ යන මහත්වරුන් ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් ද සහභාගී විය.












NEWS
NEWS CENTER
ITNnews.






මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.